

# කාගෙද මල්ල

ලිව්වේ: සුභාෂිනි නැන්දා
ඇන්දේ: තිලෝකා නැන්දා



අබරං දවසක් මල්ලක් හොරකම් කළා.
එයා මල්ල හංගලා කැලයට ගියා.



LK-LLP-13-0023_Text_SecretOwner.indd 2 6/18/23 22:53



ආරෝන්, බාරෝන් ඒක දැක්කා.
අබරංගේ මල්ල හොරකම් කළා.



LK-LLP-13-0023_Text_SecretOwner.indd 3 6/18/23 22:53



අබරං කැලයෙන් එළියට ආවා.
ආරොන්ලා ළඟට දුවලා ගියා.



LK-LLP-13-0023_Text_SecretOwner.indd 4 6/18/23 22:53



ඒත් මල්ල මගේ කියන්න බය වුණා.
බාරොන්ලා එක්කම ගමන ගියා.



LK-LLP-13-0023_Text_SecretOwner.indd 5 6/18/23 22:53



තුන්දෙනා ඒදණ්ඩක් ළඟට ආවා.

"මං මල්ල ගෙනියන්නං" ආරොන් කිව්වා.



LK-LLP-13-0023_Text_SecretOwner.indd 6 6/18/23 22:53



''එපා... යන්න එපා... මල්ල වැටෙයි.''
අබරං කෑගැහුවා.



LK-LLP-13-0023_Text_SecretOwner.indd 7 6/18/23 22:53



''ඔව් මල්ල හරි බරයි.''

''අපි මල්ල දෙකට බෙදමු'' බාරොන් කිව්වා.



LK-LLP-13-0023_Text_SecretOwner.indd 8 6/18/23 22:53



''එපා බෙදන්න එපා''
අබරං ආයෙත් කෑගැහුවා.



LK-LLP-13-0023_Text_SecretOwner.indd 9 6/18/23 22:53



''මේ ඔයා යන තැනක යන්න.''
''අපි මල්ල දෙකට බෙදනවාමයි''
බාරොන් කිව්වා.



LK-LLP-13-0023_Text_SecretOwner.indd 10 6/18/23 22:53



අබරං හොඳට ම කලබල වුණා.
''මෙන්න හොරු අල්ලපියෝ ''
කියලා කෑගැහුවා.



LK-LLP-13-0023_Text_SecretOwner.indd 11 6/18/23 22:53



එතකොට ම ආරච්චිලා දුවගෙන ආවා.
''කාගෙද මේ මල්ල'' කියලා ඇහුවා.



LK-LLP-13-0023_Text_SecretOwner.indd 12 6/18/23 22:53



''අනේ අපේ නෙමෙයි'' තුන්දෙනාම කිව්වා.



LK-LLP-13-0023_Text_SecretOwner.indd 13 6/18/23 22:53



“එහෙම ද? එහෙනං මල්ල ඇළට දාපං” ආරච්චි අණ කළා.



LK-LLP-13-0023_Text_SecretOwner.indd 14 6/18/23 22:53



ඉතින් සයිමන් මාමා එහෙම කළා.
''අපොයි'' කියලා අබරං ඇළට පැන්නා.



LK-LLP-13-0023_Text_SecretOwner.indd 15 6/18/23 22:53



අනේ අපේ අබරං!
ආරච්චිගේ නුවණට පැරදුනා.



LK-LLP-13-0023_Text_SecretOwner.indd 16 6/18/23 22:53